සංචාරක පැමිණීම් පිළිබඳව වඩා යෝග්‍ය මිණුම් දණ්ඩක් වන සංචාරකයන් රට තුළ ගත කරන දින ගණන, 1981 දී සියයට 13 ක වාර්ෂික වර්ධන වේගයක් දක්වමින් දශ ලක්ෂ 4 ක් බවට පත් විය. එහෙත්, විමසුමට ලක් කරන වර්ෂයේ සංචාරක දින ගණනේ වර්ධන වේගය පසුගිය වර්ෂ පහ තුළ දක්නාලද එම වේගයනට වඩා අඩු වීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 1980 දී දින 11·0 ක් ලෙස පැවති සංචාරකයකු දිවයිනේ ගත කරන සාමාන්‍ය දින ගණන 1981 දී, 10·8 දක්වා පහත වැටිණි.

නවාතැන්, ආහාර පාන, ගමනා ගමන, විවිධ භාණ්ඩ මිලට ගැනීම් හා විනෝදාත්මක කටයුතු සඳහා සංචාරකයන් කරනු ලබන වියදම්වලින් ද සමන්විත වූ සංචාරක ව්‍යාපාරයේ මුළු ඉපැයීම්, විමසුමට ලක් කරන වර්ෂයේදී, රුපියල් දශ ලක්ෂ 2,500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත[1]. පසුගිය වර්ෂයේ ප්‍රමාණයට වඩා සියයට 36 ක වර්ධනයක් එයින් පිළිබිඹු විය. සංචාරක ව්‍යාපාරයෙන් ලැබූ දළ ඉපයීම්, ඇමරිකානු ඩොලර් වශයෙන් සියයට 17 ක වර්ධනයක් පෙන්වමින්, දශ ලක්ෂ 130 ක් වූ අතර, විශේෂ හැර ගැනීමේ අයිතීන් අනුව, එහි වටිනාකම 1980 පැවති දශ ලක්ෂ 85 සිට සියයට 30 ක වර්ධනයක් දක්වමින් 1981 දී, දශ ලක්ෂ 110 ක් විය.

මෙතෙක් ප්‍රධාන වෙළෙඳපොළ වූ බටහිර යුරෝපය 1981 දී ද, සංචාරක පැමිණීම්වලින් සියයට 66 කට හිමිකම් කියමින් වෙළෙඳපොළේ නායකත්වය දිගටම පවත්වා ගැනීමට සමත් විය. පසුගිය වර්ෂයට වඩා සියයට 2 ක වර්ධනයක් පෙන්වමින් දෙවන ප්‍රධාන වෙළෙඳපොළ බවට පත් වූ ආසියාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 24 ක් නිරූපණය කළේය. පසුගිය වර්ෂයේදී මෙන් මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 4 ක් උතුරු අමෙරිකානු වෙළෙඳ පොළෙන් විය.

1981 දී ද සංචාරකයන් මෙරටට පැමිණීමේ මූලික පරමාර්ථය ලෙස තවදුරටත් මුල් තැන ගත්තේ විනෝදාශ්වාදය ලැබීමය. මෙම වර්ෂයේ පැමිණි මුළු සංචාරකයන්ගෙන් 3,31,638 ක්ම විනෝදාශ්වාදය පරමාර්ථ කොට පැමිණීමෙන් මේ බව සනාථ වේ. මේ අනුව, විනෝදාශ්වාදය පතා වූ පැමිණීම් මුළු පැමිණීම්වලින් සියයට 90 ක් පිළිබිඹු කළ අතර, ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු ගණනින් සියයට 4 ක් ලෙස දිස් විය. 1981 දී විනෝදාශ්-වාදය පතා පැමිණි අයගේ වර්ධන අනුපාතය මුළු සංචාරක දින ගණනේ වර්ධක අනුපාතය හා අනුකූලතාවයක් දක්වමින් සියයට 14 ක්වූ අතර ව්‍යාපාරික අරමුණු සඳහා වූ පැමිණීම් සියයට 22 කින් ඉහළ නැගුණි.

විදේශ විනිමය ඉපයීමේ සාධකයක් ලෙස සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම් ගෙවුම් තුලන සංඛ්‍යා දත්තයන් දෙස බැලීමෙන් පෙනේ. 1975 දී සේවා ගිණුමේ ලැබීම්වලින් සියයට 22 ක් වූ සංචාරක ඉපයීම්, 1980 දී සියයට 35 ක් දක්වා ඉහළ ගිය අතර 1981 දී සියයට 39 දක්වා තවදුරටත් වැඩි විණ. 1980 දී මෙරට විදේශ විනිමය ඉපයීමේ මාර්ග අතුරින් හතරවන වැදගත් ස්ථානයට පත් වූ සංචාරක ව්‍යාපාරය, 1981 දී පස් වන ස්ථානය හිමිකර ගති.

රජයේ රැකියා සැපයීමේ ප්‍රයත්නයට සතුටුදයක ලෙස සහයෝගය දක්වමින් සංචාරක ව්‍යාපාරය මගින් 1981 වර්ෂයේදී 52,800 දෙනෙකුට රැකියා මාර්ග උත්පාදනය කරනු ලැබුණි. මෙය පසුගිය වර්ෂය හා සසඳන කල සියයට 10 ක වැඩි වීමක් පෙන්විය. සංචාරක අංශය මගින් සැපයුන මුළු රැකියා ප්‍රමාණයෙන් 22,000 ක් සෘජු ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වූ රැකියා වූ අතර වක්‍ර ලෙස ඊට සම්බන්ධ වූ රැකියා ප්‍රමාණය 30,800 ක් ලෙස ගණන් බලා ඇත. මේ අනුව, 1981 දී සංචාරක ව්‍යාපාරය නිසා සෘජු වශයෙන් හට ගත් රැකියා සංඛ්‍යාව පසුගිය වර්ෂය හා සසඳන කල වඩාත් ඉහළ වේගයකින් වර්ධනය වී ඇත.

## ගෙවුම් තුලනය

1981 දී ගෙවුම් තුලන තත්ත්වය සැළකියයුතු දියුණුවක් පෙන්නුම් කළේය. මෙම වර්ධනයට තරමක් දුරට හේතු වූයේ අනුගමනය කරන ලද යෝග්‍ය වූ ඉල්ලුම් පාලන සහ නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තීන් ය. විනිමය අනුපාතිකයේ ඇති වූ වෙනස්වීම්, රාජ්‍ය අංශයේ වියදම් වර්ධනය කපාහැරීම සහ මූල්‍ය පාලන ප්‍රතිපත්ති යන සියල්ලම වර්ෂය තුළ දී රටට ගලා ආ ආනයන වල වර්ධන වේගය අඩු කරලීමට උපකාරී විය. මෙසේ ආනයන වර්ධන වේගය අඩුවීම සමග අපනයන ඉපැයීම්වල ඇති වූ පැහැදිළි වැඩිවීම වෙළඳ ශේෂයේ හිඟය පාලනය කළහැකි මට්ටමක පවත්වා ගෙන යාමට උපකාරී විය. 1980 වර්ෂය සමහ සසඳන කළ පවුවූ වෙළඳ ශේෂ හිඟයට අමතරව විශාල වශයෙන් සංක්‍රාම ගලා ඒම ජංගම ගිණුමෙහි හිඟය සැළකිය යුතු ලෙස අඩු වීමට හේතු විය. අනික් අතට විදේශීය ණය, සෘජු ආයෝජන

1. සංචාරක මණ්ඩලය විසින් කරන ලද ඇස්තමේන්තු.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

සහ කෙටිකාලීන ණය ගැණුම් ස්වරූපයෙන් ගලා ආ ප්‍රාග්ධනය වැඩි වීමක් වර්ෂය තුළදී දක්නට ලැබුණි. මෙය 1981 සමස්ථ ගෙවුම් තුලනයෙහි හිඟය ඊට පෙර වර්ෂයේ විශාල හිඟයෙන් සුළු කොටසක් බවට පත් කිරීමට තරම් උපකාරී විය. මේ නිසා 1981 දී සමස්ථ ගෙවුම් ශේෂ හිඟය පියවීම සඳහා ශුද්ධ විදේශ වත්කම් යොදා ගැනීමට සිදුවූයේ ඉතා මඳ වශයෙනි.

1981 වර්ෂයේ සමස්ත ගෙවුම් තුලන තත්ත්වය තරමක් දුරට සතුටුදායක වුවත්, යම් යම් අවාසිදායක වෙනස්කම් කීපයක් ද ඇති විණි. 1977 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්ති සමුදාය මගින් කෙටි කාලීන වශයෙන් ජංගම ගිණුමේ හිඟයෙහි අඛණ්ඩ වැඩිවීමක් අපේක්ෂා කළේය. වේගවත් කළ ආයෝජන වැඩ පිළිවෙල සමග නිර්බාධිත වෙළඳ ප්‍රතිපත්ති නිසා මුල් වර්ෂ කීපය තුළදී ආනයන සැළකියයුතු ලෙස ඉහළ මට්ටමක පැවතේ යයි අපේක්ෂා කෙරුණි. අනික් අතට අපනයන අංශය දැඩි විවිධාංගීකරණයක් පෙන් වමින් වර්ධනය වේ යයි ද බලාපොරොත්තු විය. පෞද්ගලික ප්‍රාග්ධන, නිල ප්‍රාග්ධන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය පහසුකම් යටතේ ලැබෙන සම්පත් තුලින් මුල් වර්ෂවල ඇති වන ගෙවුම් හිඟ පියවීමට අදහස් කෙරුණි.

පසුගිය වර්ෂය සමග සසඳන කළ වෙළඳ ගිණුමේ සහ ජංගම ගිණුමේ හිඟය අඩු වුවද, එය 1981 දී ද ඉහළ මට්ටමක පැවතුණි. වර්ෂය තුලදී ඉහළ මට්ටමක පැවති අතරමැදි හා ආයෝජන භාණ්ඩ ආනයනය විශාල වෙළඳ ශේෂ හිඟයක් ඇති කිරීමට ප්‍රධාන හේතුව විය. රාජ්‍ය අංශයේ සංවර්ධන යෝජනා ක්‍රම සඳහා කරන ලද අතරමැදි හා ආයෝජන භාණ්ඩ ආනයන, ආනයනික වියදමින් හතරෙන් තුනක් පමණ විය. මෙම භාණ්ඩ ආනයන කපා හැරියේ නම් රටේ සංවර්ධන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් අහිතකර බලපෑම් ඇති වීමට ඉඩ තිබුණි. කෙසේ වුවත් මෙම භාණ්ඩ ආනයන වලින් සැළකියයුතු ප්‍රමාණයක් ව්‍යාපෘති ආධාර යටතේ මූල්‍යකරණය කෙරිණ. 1981 වර්ෂයේ වෙළඳ ශේෂ හිඟයට හේතු වූ තවත් කරුණක් වූයේ 1979/80 වර්ෂයේදී ඔපෙක් විසින් ඛනිජ තෙල් මිල ඉහළ නැංවීමෙන් පසුව ඛනිජ තෙල් ආනයන සඳහා කරන ලද ගෙවීම් සැළකිය යුතු ලෙස වැඩි වීමයි. 1981 රටෙහි අපනයන ඉපැයීම් වලින් අඩක් පමණ ඛනිජ තෙල් ආනයන සඳහා යෙදවීමට සිදු විය. ජංගම ගිණුමේ විශාල හිඟය පියවීම සඳහා විදේශ වලින් මූල්‍ය සම්පත් ලබා ගැනීමට සිදුවිය. විදේශීය ආධාර ණය, ප්‍රදාන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැනීම් වැනි සම්ප්‍රදායික මාර්ග වලින් ලැබෙන මූල්‍ය සම්පත් ප්‍රමාණය සීමිත වූ බැවින්, හිඟය පියවීම සඳහා වෙනත් මාර්ග වලින් මූල්‍ය සම්පත් සොයා ගැනීම අවශ්‍ය විය. මේ අනුව ගෙවීම් හිඟය පියවීමෙහි රටාව සැළකිය යුතු ලෙස වර්ෂය තුළ දී වෙනස්වූ අතර, වෙළඳ ණය ලබා ගැනීම් වල විශාල වැඩිවීමක් ඇති විය. 1981 දී ගෙවුම් තුලනය සම්බන්ධයෙන් ඇති වූ වඩාත්ම අහිතකර සිදුවීම මේ විය.

**ගෙවුම් තුලන විග්‍රහය**

ජංගම ගිණුමේ හිඟය 1980 දී රුපියල් දශලක්ෂ 10,912 සිට (විගැහි දශලක්ෂ 507) 1981 දී රුපියල් දශලක්ෂ 9,090 (විගැහි දශලක්ෂ 404) දක්වා අඩු විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශත යක් වශයෙන් 1980 දී සියයට 16 ක්ව තිබූ ජංගම ගිණුමේ ශේෂය 1981 දී සියයට 11 දක්වා පහත වැටුණි. ජංගම ගිණුමේ හිඟය අඩු වීම විශාල වශයෙන් ආනයන වර්ධනය අඩුවීමේ සහ පෞද් ගලික සහ නිල සංක්‍රාම ගලා ඒම වැඩිවීමේ ප්‍රතිඵලයක් විය. ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ගලා ඒම මීට පෙර වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 6,585 (විගැහි දශලක්ෂ 306) සමග සසඳන කළ 1981 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 7,663 (විගැහි දශලක්ෂ 340) ක් විය. ප්‍රාග්ධනය ගලා ඒමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ගෙවුම් ශේෂ හිඟය 1980 වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 2,967 (විගැහි දශලක්ෂ 166) සමග සසඳන කල 1981 වර්ෂයේ දී එය රුපියල් දශලක්ෂ 406 (විගැහි දශලක්ෂ 26) ක පමණ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. ශුද්ධ ජාත්‍යන්තර සංචිත, සමස්ත ගෙවුම් ශේෂ හිඟයේ ප්‍රමාණයෙන් ම පහත වැටුණි. කෙසේ වුවත් දළ විදේශීය වත්කම් වර්ෂය තුළ දී වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය සම්පූර්ණයෙන්ම වාගේ මහ බැංකුවේ විදේශීය ද්‍රවශීල වත්කම් තුලින් පිළිබිඹු කෙරුණි. 1981 අවසානයේ පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය, 1982 සඳහා සිදු කිරීමට බලාපොරොත්තු වූ ආනයන වියදමින්, මාස දෙකක ප්‍රමාණය පියවීමට ප්‍රමාණවත් විය.

මුළු අපනයන ඉපයීම් 1980 දී රුපියල් දශ ලක්ෂ 17,603 (විගැහි දශලක්ෂ 818)සිට 1981 දී රුපියල් දශලක්ෂ 20,440 (විගැහි දශ ලක්ෂ 900) දක්වා හෙවත් සියයට 10 කින් (විගැහි අනුව) වැඩි විය. අපනයන ඉපැයීම් වර්ධනය වූයේ ප්‍රධාන වශයෙන්ම මසා නිමකළ ඇඳුම්, සුළු අපනයන භෝග සහ ඛනිජ තෙල් නිෂ්පාදිත වැනි සම්ප්‍රදායික නොවන අපනයන වලින් ලත් ඉපැයීම් වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ අතර සම්ප්‍රදායික අපනයන වලින් ලත් ඉපැයීම් සුළු වැඩිවීමක් පෙන්නුම් කළේය.

# 1 · 29 සංඛ්‍යා සටහන

## ගෙවුම් තුලනය – විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම 1977—1981

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1977 | 1978 | 1979 | 1980 (අ) | 1981 (ආ) | 1977 | 1978 | 1979 | 1980 (අ) | 1981 (ආ) |
| 1· වෙළඳ භාණ්ඩ .. | + 350 | − 2,393 | − 7,288 | −16,312 | −16,192 | + 29 | − 144 | − 362 | − 758 | − 716 |
| අපනයන (නැ.වි.ස.) .. | 6,640 | 13,207 | 15,282 | 17,603 | 20,440 | 651 | 675 | 759 | 818 | 900 |
| ආනයන (පි.ර.ගැ.) .. | − 6,290 | −15,600 | −22,570 | −33,915 | −36,632 | − 622 | − 819 | −1,121 | − 1,576 | − 1,616 |
| 2· සේවා .. | + 304 | + 119 | + 739 | + 859 | + 136 | + 29 | + 6 | + 37 | + 40 | + 6 |
| ලැබීම් .. | 923 | 1,942 | 2,992 | 4,605 | 5,815 | 89 | 99 | 149 | 214 | 256 |
| ගෙවීම් .. | − 619 | − 1,823 | − 2,253 | − 3,746 | − 5,679 | − 60 | − 93 | − 112 | − 174 | — 250 |
| 3· භාණ්ඩ හා සේවා (1+2) .. | + 654 | − 2,274 | − 6,549 | −15,453 | −16,056 | + 58 | − 138 | − 325 | − 718 | 710 |
| 4· සංක්‍රාම (ශුද්ධ) .. | + 612 | + 1,242 | + 2,993 | + 4,541 | + 6,966 | + 59 | + 63 | + 148 | + 211 | + 306 |
| පෞද්ගලික (ශුද්ධ) .. | 122 | 342 | 754 | 2,260 | 3,848 | 12 | 17 | 37 | 105 | 170 |
| නිල (ශුද්ධ) .. | 490 | 900 | 2,239 | 2,281 | 3,118 | 47 | 46 | 111 | 106 | 136 |
| 5· ජංගම ගිණුම් ශේෂය .. | + 1,266 | − 1,032 | − 3,556 | −10,912 | − 9,090 | + 117 | − 75 | − 177 | − 507 | − 404 |
| 6· මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. | + 326 | + 2,600 | + 3,306 | + 6,585 | + 7,663 | + 32 | + 133 | + 164 | + 306 | + 340 |
| පෞද්ගලික අංශය .. | − 127 | 145 | 874 | 3,895 | 2,543 | − 12 | 8 | 43 | 181 | 116 |
| රාජ්‍ය අංශය .. | 453 | 2,455 | 2,432 | 2,690 | 5,120 | 44 | 125 | 121 | 125 | 224 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 602 | 2,609 | 2,432 | 2,690 | 5,120 | 58 | 133 | 121 | 125 | 224 |
| ලැබීම් .. | (1,319) | (3,680) | (3,351) | (4,326) | (6,087) | (127) | (188) | (167) | (201) | (268) |
| ගෙවීම් .. | (−717) | (−1,071) | (−919) | (−1,636) | (−967) | (−69) | (−55) | (−46) | (−76) | (−44) |
| කෙටි කාලීන (ශුද්ධ) .. | − 149 | − 154 | — | — | — | − 14 | − 8 | — | — | — |
| 7· රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | + 1,680 | + 344 | − 18 | + 607 | − 39 | — | — | — | — | — |
| 8· වැරදීම් සහ අත්හැරීම් .. | + 41 | − 50 | + 820 | + 495 | + 808 | + 4 | + 7 | + 36 | + 23 | + 26 |
| 9· විගැහි වෙන්කිරීම .. | — | — | 241 | 258 | 252 | — | — | 12 | 12 | 12 |
| 10· සමස්ථ ශේෂය .. | + 3,313 | + 1,861 | + 793 | − 2,967 | − 406 | + 153 | + 65 | + 35 | − 166 | − 26 |
| 11· මූල්‍ය වෙනස්වීම් (−අතිරික්තය) .. | − 3,313 | − 1,861 | − 793 | + 2,967 | + 406 | − 153 | − 65 | − 35 | + 166 | + 26 |
| ශ්‍රී ලංකා රුපියල්/විගැහි පරිවර්තන කිරීමේ අනුපාතිකය (වාර්ෂික සාමාන්‍යය) .. | | | | | | 10·42 | 19·58 | 20·13 | 21·52 | 22·67 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: ජංගම ගිණුමෙහි සියළු ගනුදෙනු සහ මූල්‍ය නොවන අංශයේ ප්‍රාග්ධන අයෝජන වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය යොද පරිවර්තනය කොට ඇත. මූල්‍ය ආයෝජන කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

ආනයන ගෙවීම් සියයට 3 ක් (විගැහි අනුව) වැනි සුලු අඩු අනුපාතයකින් වැඩිවූ අතර, එය 1980 දී රුපියල් දශලක්ෂ 33,915 (විගැහි දශලක්ෂ 1,576) සිට 1981 දී රුපියල් දශලක්ෂ 36,632 (විගැහි දශලක්ෂ 1,616) දක්වා වැඩි විය. විගැහි අනුව පසු ගිය අවුරුදු තුන ඇතුළතදී සටහන්වී ඇති, වර්ෂයකට සාමාන්‍යයෙන් සියයට 36 ක් වූ වේගවත් වැඩිවීම සමහ සසඳන කළ මෙය සැළකිය යුතු වෙනසකි. 1981 දී ආනයන වර්ධනය හීනවීම අනුගමනය කරන ලද වඩා සුදුසු ඉල්ලුම් පාලන ප්‍රතිපත්ති සහ විනිමය අනුපාතිකය යෝග්‍ය පරිදි වෙනස්වීම් තරමක් දුරට පිළිබිඹු වීමකි. යම් යම් බදු සහන, විශේෂයෙන්ම එක්වර ක්ෂය කිරීමේ ක්‍රමය ඉවත් කිරීමද ආනයන වර්ධනය අඩු කර ලීමට උපකාරී විය.

1980 දී රුපියල් දශ ලක්ෂ 859 (විහැහි දශලක්ෂ 40) ක් වූ ගෙවුම් තුලනයේ සේවා ගිණුම් අතිරික්තය හා සැසඳීමේ දී, මෙම වර්ෂය තුළ රුපියල් දශලක්ෂ 136 (විගැහි දශලක්ෂ 6) ක සුළු අතිරික්තයක් පෙන්නුම් කළේය. 1978 වර්ෂය හැරුණු විට 1973 සිට 1980 දක්වා වූ සෑම වර්ෂයකදීම සේවා ගිණුම අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින් ජංගම ගිණුමේ තත්ත්වය යහපත් අතට හැරවීමට උපකාරී විය. විදේශීය ණය සඳහා විශාල වශයෙන් පොළී ගෙවීමට සිදුවීම නිසා 1981 දී මෙම උපනතිය ප්‍රතිවිරුද්ධ අතට පෙරලී ඇති බවක් දක්නට ලැබේ. සංචාරක ඉපැයීම්, වරාය සේවාවන් සහ විදේශ වත්කම් ආදිය සේවා ගිණුමේ ප්‍රධාන ඉපැයීම් මාර්ග විය.

විදේශීය ණය සඳහා පොළී ගෙවීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැනීම් සහ වෙළඳ ණය, 1980 දී රුපියල් දශ ලක්ෂ 968 (විගැහි දශලක්ෂ 45) සිට 1981 දී රුපියල් දශලක්ෂ 2,116 (විගැහි දශලක්ෂ 93) දක්වා වැඩි විය. ඛනිජ තෙල් නොමැති අනිකුත් දියුණු වෙමින් පවත්නා රටවල මෙන් ආනයන සඳහා යොදා ගැනීමට හැකිව තිබූ භාණ්ඩ සහ සේවා අපනයන වලින් ලත් ඉපැයීම් වලින් සැළකිය යුතු කොටසක් විශාල වශයෙන් පොළී ගෙවීම් සඳහා වියදම් කිරීමට සිදු විය. භාණ්ඩ සහ සේවා අපනයනයෙන් ලත් ඉපැයීම් වලින් පොළී ගෙවීම් සඳහා (ජා.මූ.අ.ට. කළ ගෙවීම් ඇතුලත්ව) 1980 දී වැය වූ සියයට 4 සමග සසඳන විට, එය 1981 දී සියයට 8 ක් පමණ විය. විදේශ වත්කම් ආයෝජනයෙන් ලැබූ පොළී ආදායම් 1981 දී රුපියල් දශලක්ෂ 555 (විගැහි දශලක්ෂ 25) ක් විය. ශුද්ධ පොළී ගෙවීම් 1980 දී රුපියල් දශලක්ෂ 194 (විගැහි දශලක්ෂ 9) සිට 1981 දී රුපියල් දශලක්ෂ 1,561 (විගැහි දශලක්ෂ 68) දක්වා වැඩි විය.

**1 · 30 සංඛ්‍යා සටහන**

**සේවා සහ සංක්‍රාම, 1980 – 1981**

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1980 | 1981 | වෙනස 1980/81 | 1980 | 1981 | වෙනස 1980/81 | 1980 | 1981 |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 725 (34) | 986 (43) | + 261 (+9) | 560 (26) | 747 (33) | + 187 (+7) | + 165 (+8) | + 239 (+10) |
| සංචාර .. | 1,637 (76) | 2,270 (100) | + 633 (+24) | 556 (26) | 749 (33) | + 193 (+7) | +1,081 (+50) | +1,521 (+67) |
| ආයෝජන ආදයම් .. | 774 (36) | 555 (25) | − 219 (−11) | 1,205 (56) | 2,230 (98) | +1,025 (+42) | − 431 (−20) | −1,675 (−73) |
| 1. ලාභ සහ ලාභාංශ .. | — (—) | — (—) | — (—) | 237 (11) | 114 (5) | − 123 (−6) | − 237 (−11) | − 114 (−5) |
| 2. පොළී .. | 774 (36) | 555 (25) | − 219 (−11) | 968 (45) | 2,116 (93) | +1,148 (+48) | − 194 (−9) | −1,561 (−68) |
| රජයේ වියදම් .. | 128 (6) | 191 (8) | + 63 (+2) | 123 (6) | 137 (6) | + 14 (−) | + 5 (−) | + 54 (+2) |
| විවිධ සේවා .. | 1,341 (62) | 1,813 (80) | + 472 (+18) | 1,302 (60) | 1,816 (80) | + 514 (+20) | + 39 (+2) | − 3 (−) |
| මුළු සේවා .. | 4,605 (214) | 5,815 (256) | +1,210 (+42) | 3,746 (174) | 5,679 (250) | +1,933 (+76) | + 859 (+40) | + 136 (+6) |
| පෞද්ගලික සංක්‍රාම .. | 2,518 (117) | 4,402 (194) | +1,884 (+77) | 258 (12) | 554 (25) | + 296 (+13) | +2,260 (+105) | +3,848 (+169) |
| නිළ සංක්‍රාම .. | 2,281 (106) | 3,118 (136) | + 837 (+30) | — (—) | — (—) | — (—) | +2,281 (+106) | +3,118 (+136) |
| මුළු සංක්‍රාම .. | 4,799 (223) | 7,520 (330) | +2,721 (+107) | 258 (12) | 554 (25) | + 296 (+13) | +4,541 (+211) | +6,966 (+305) |
| මුළු සේවා සහ සංක්‍රාම .. | 9,404 (437) | 13,335 (586) | +3,931 (+149) | 4,004 (186) | 6,233 (275) | +2,229 (+89) | +5,400 (+251) | +7,102 (+311) |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සංචාරකයින්ගේ පැමිණීම සියයට 15 කින් වැඩිවීමත්, එක් සංචාරකයෙකුගේ වියදම සියයට 14 කින් වැඩි වීමත්, සංචාරක ඉපැයීම් 1981 දී සියයට 32 කින් (විගැහි අනුව) හෙවත් රුපියල් දශලක්ෂ 2,270 (විගැහි දශ ලක්ෂ 100) දක්වා වැඩිවීමට හේතු විය. ශ්‍රී ලාංකිකයින්ගේ විදේශීය ගමන් සඳහා කරනු ලැබූ රුපියල් දශලක්ෂ 749 (විගැහි දශලක්ෂ 33) ක ප්‍රමාණය සැළකිල්ලට ගත් පසු ශුද්ධ සංචාරක ඉපැයීම් පෙර වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 1,081 (විගැහි දශලක්ෂ 50) සමග සසඳන කළ 1981 දී එය රුපියල් දශලක්ෂ 1,521 (විගැහි දශලක්ෂ 67) දක්වා වැඩි වුණි.

ප්‍රධාන වශයෙන් විදේශීය රක්ෂාවල නියුතු ශ්‍රී ලාංකිකයින් විසින් කරන ලද ප්‍රේෂණ යන්ගෙන් සමන්විත වන පෞද්ගලික සංක්‍රාම වලින් ලත් ලැබීම් (විගැහි අනුව) සියයට 66 කින් හෙවත් 1980 දී රුපියල් දශලක්ෂ 2,518 (විගැහි දශලක්ෂ 117) සිට 1981 දී රුපියල් දශලක්ෂ 4,402 (විගැහි දශලක්ෂ 194) දක්වා වැඩි විය. මෙම ප්‍රේෂණ වලින් වැඩි කොටසක් කරන ලද්දේ වැඩි වශයෙන්ම සෞදි අරාබිය, කුවේට්, ඕමාන්, එක්සත් අරාබි රාජ්‍යයන් සහ බහරේන් වැනි මැද පෙරදිග රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් විසිනි. එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ බටහිර ජර්මනිය ඇතුලු අනිකුත් රටවලින්ද මෙම ප්‍රේෂණ වලින් සැළකිය යුතු කොටසක් ලැබුණි.

විදේශීය ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන වලින් ලත් නිල සංක්‍රාම සියයට 28 කින් (විගැහි අනුව) හෙවත් 1980 දී රුපියල් දශලක්ෂ 2,281 (විගැහි දශලක්ෂ 106) සිට 1981 දී රුපියල් දශලක්ෂ 3,118 (විගැහි දශලක්ෂ 136) දක්වා වැඩිවුණි. නිල ප්‍රදානයන් ගෙන් සියයට 64 ක් පමණ ව්‍යාපෘති ආධාර වශයෙන් ලැබුණි. ප්‍රධාන අනුග්‍රාහකයන් වූයේ එක්සත් රාජධානිය, ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන අධිකාරිය, ජපානය, යුරෝපීය ආර්ථික හවුල සහ එක්සත් ජනපදයයි. ද්‍රව්‍ය ආධාර දීමනා වලින් වැඩි කොටසක් සපයන ලද්දේ නෙදර්ලන්තය, එක්සත් ජනපදය, ජපානය සහ නෝර්වේ යන රටවල් වලිනි.

1981 දී විදේශ සම්පත් පරතරයෙන් වැඩි කොටසක් පියවනු ලැබුවේ මූල්‍ය නොවන ප්‍රාග්ධන මගිනි. මෙම ප්‍රාග්ධන ලැබීම්, ඍජු ආයෝජන මෙන්ම විදේශීය ණය ගැනීම් වලින්ද සමන්විත විය. මෑත අතීතයේදී ප්‍රාග්ධන ගලා ඒමේ රටාවෙහි සැළකිය යුතු වෙනසක් සිදුවී ඇත. සැලකිය යුතු වෙනසක් වූයේ 1980 සිට වෙළඳ ණය වැඩිවීමයි. සමහර රාජ්‍ය දෙපාර්ත මේන්තු, රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික ව්‍යවසායකයින් ගණනාවක්ම ආනයනික වගකීම් පියවීම සඳහා වෙළඳ ණය ලබාගැනීමට යොමු වූහ. ලංකා ගුවන් සේවය, සිමෙන්ති සංස්ථාව සහ නැව් සංස්ථාව මින් ප්‍රධාන තැනක් ගනී. සමහර ව්‍යවසායකයින් වැඩි වශයෙන්ම ආයෝජන සංවර්ධන කලාපයීය ආයෝජකයෝ විදේශ මුදල් බැංකු ඒකකයන්ගෙන් ණය පහසුකම් ලබා ගත්හ. කෙසේ වුවත් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් සඳහා ඇදී ආ ශුද්ධ විදේශීය ප්‍රාග්ධන ය සියයට 35 කින් හෙවත් 1980 දී රුපියල් දශලක්ෂ 3,895 (විගැහි දශලක්ෂ 181) සිට 1981 දී රුපියල් දශලක්ෂ 2,543 (විගැහි දශලක්ෂ 116) දක්වා අඩු විය. මෙය මුළුමනින්ම වාගේ ඛනිජතෙල් සංස්ථාව විසින් ලබා ගනු ලැබූ කෙටිකාලීන වෙළඳ ණය අඩුවීම නිසා සිදු වූවකි.

මුද හරිනු ලැබූ මුළු නිළ ණය ප්‍රමාණය 1980 දී රුපියල් දශලක්ෂ 4,326 (විගැහි දශ ලක්ෂ 201) සිට 1981 දී රුපියල් දශලක්ෂ 6,087 (විගැහි දශලක්ෂ 268) දක්වා වැඩි වුණි. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්ම ව්‍යාපෘති ණය සහ යුරෝපීය මුදල් ණය මුද හැරීම් වැඩිවීම නිසා සිදු වූවකි. දළ රාජ්‍ය ප්‍රාග්ධන ගලා ඒම් ව්‍යාපෘති ණය (රුපියල් දශලක්ෂ 2,358 හෙවත් විගැහි දශලක්ෂ 104), භාණ්ඩ ණය (රුපියල් දශලක්ෂ 1,542 හෙවත් විගැහි දශලක්ෂ 68), යුරෝපීය මුදල් ණය (රුපියල් දශලක්ෂ 1,451 හෙවත් විගැහි දශලක්ෂ 64) සහ වෙළඳ ණය (රුපියල් දශලක්ෂ 736 හෙවත් විගැහි දශලක්ෂ 32) යන මේවායින් සමන්විත විය.

විවිධ පහසුකම් යටතේ වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවට රුපියල් දශලක්ෂ 4,528 (විගැහි දශලක්ෂ 194) ප්‍රමාණයක ආධාර ලබා දෙනු ලැබීය. දීක්කළ අරමුදල් පහසුකම් යටතේ අවසාන හැර ගැනීම වූ රුපියල් දශලක්ෂ 3,307 (විගැහි දශලක්ෂ 150) 1981 දී වාරික හතරකින් ලැබුණි. මෙම හැර ගැනීමත් සමග 1979–1981 කාලය සඳහා වූ දීක් කළ අරමුදල් පහසුකම් ක්‍රමය යටතේ විගැහි දශලක්ෂ 260.3 ක් ශ්‍රී ලංකාව ලබා ගත්තේය. මීට අමතරව 1980 දී වූ අපනයන පහත වැටීම වෙනුවෙන් 1981 ජූනි මාසයේ දී සහනදායී මූල්‍ය පහසුකම් යටතේ රුපියල් දශලක්ෂ 556 (විගැහි දශලක්ෂ 25) ක හැර ගැනීමක් කරනු ලැබීය. 1980 දෙසැම්බර් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ශ්‍රී ලංකාවේ සලාකය වැඩිවීමේ හේතුවෙන් රිසර්ව් ට්‍රාන්ච් හි ඇතිවූ තත්ත්වය මත වි. ගැ. හි. දශ ලක්ෂ 19 ක (රුපියල් දශලක්ෂ 412) විශේෂ හැර ගැනීමක්ද ජා.මු.අ. මගින් ලබාදෙන ලදී. විගැහි වෙන් කිරීම් යටතේ සිව්වෙනි මූලික කාලච්ඡේදය සඳහා ලැබෙන අවසන් කොටස වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් දශ ලක්ෂ 252 (විගැහි දශලක්ෂ 12) ක් ද ලැබුණි.

## 1 · 31 සංඛ්‍යා සටහන

### විදේශ සම්පත් පරතරය පියවීම, 1979 — 1981

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1979 | 1980 | 1981 | 1979 | 1980 | 1981 |
| **1· විදේශීය ඉපැයීම්** .. | **19,210** | **24,726** | **30,658** | **954** | **1,154** | **1,350** |
| 1·1 අපනයන .. | 15,282 | 17,603 | 20,440 | 759 | 823 | 900 |
| 1·2 සේවා .. | 2,993 | 4,605 | 5,815 | 149 | 214 | 256 |
| 1·3 පෞද්ගලික සංක්‍රාම .. | 935 | 2,518 | 4,403 | 46 | 117 | 194 |
| **2· විදේශීය ගෙවීම්** .. | **26,765** | **42,424** | **56,611** | **1,330** | **2,004** | **2,498** |
| 2·1 ආනයන .. | 22,570 | 33,915 | 36,632 | 1,121 | 1,573 | 1,616 |
| 2·2 සේවා .. | 2,253 | 3,746 | 5,679 | 112 | 174 | 250 |
| 2·3 පෞද්ගලික සංක්‍රාම .. | 182 | 258 | 554 | 9 | 12 | 24 |
| 2·4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 1,760 | 4,505 | 13,746 | 88 | 245 | 608 |
| **3· විදේශ සම්පත් පරතරය** .. | **– 7,555** | **– 17,698** | **– 25,953** | **– 376** | **– 850** | **– 1,148** |
| **4· සම්පත් පරතරය පියවීම** .. | **+ 7,555** | **+ 17,698** | **+ 25,953** | **+ 376** | **+ 850** | **+ 1,148** |
| 4·1 ණය තත්ත්වය කෙරෙහි බල නොපාන ගනුදෙනු තුළින් පියවීම . | 3,250 | 3,293 | 4,373 | 169 | 153 | 192 |
| 4·1·1 ප්‍රදානයන් .. | 2,239 | 2,281 | 3,118 | 111 | 106 | 136 |
| 4·1·2 සෘජු ආයෝජන .. | 769 | 754 | 1,003 | 46 | 35 | 44 |
| 4·1·3 විගැහි වෙන්කිරීම් .. | 242 | 258 | 252 | 12 | 12 | 12 |
| 4·2 ණය ලබාගැනීම් සහ සංචිත උපයෝගි කර ගැනීම .. | 3·503 | 8,015 | 20,811 | 172 | 327 | 930 |
| 4·2·1 දිගුකාලීන ණය (අ) .. | 2,903 | 4,135(අ) | 5,350 | 144 | 193 | 236 |
| 4·2·2 කෙටිකාලීන ණය .. | 41 | 4,455 | 10,518 | 2 | 207 | 465 |
| 4·2·3 සැපයුම්කරුවන්ගේ ණය .. | 609 | 1,173 | 1,184 | 30 | 55 | 53 |
| 4·2·4 වෙළඳ ණය (පෞද්ගලික අංශය) | — | — | 1,546 | — | — | 68 |
| 4·2·5 බැංකු ණය ගැනීම් .. | — | 361 | — | — | 16 | — |
| 4·2·6 ද්විපාර්ශ්වික ශේෂ .. | 413 | — | — | 20 | — | — |
| 4·2·7 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් හැර ගැනීම .. | 1,592 | 630 | 4,528 | 77 | 30 | 194 |
| 4·2·8 වෙනත් .. | 120 | 147 | 141 | 6 | 5 | 5 |
| 4·2·9 සංචිත .. | – 2,175 | – 2,886 | – 2,456 | – 107 | – 179 | – 91 |
| **5· රුපියල් අගය පිළිබඳ ගැළපිලි (ආ)** .. | **– 18** | **607** | **– 39** | **—** | **—** | **—** |
| **6· වැරදීම් හා අත්හැරීම්** .. | **+ 820** | **+ 495** | **+ 808** | **+ 35** | **– 4** | **+ 26** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1980 වේ යෝජනාක්‍රම සහ ද්‍රව්‍ය ආධාර, භාරකාර අරමුදල් ණය, යුරෝ – ඩොලර් ණය ගැනීම් වලින් සමන්විතය.

(ආ) විනිමය අනුපාතික වෙනස්වීම අනුව සිදු කරන ලද ගැලපීම් වලින් පසුව.

**ප්‍රතිපත්තිමය කරුණු**

ඉහළ මට්ටමක පිස්කල් පාලනය සහ සීමාකාරී මුල්‍ය ප්‍රතිපත්තීනුත් ඇතුළත් ඉල්ලුම් පාලන ප්‍රතිපත්ති යොද ගැනීමෙන් සහ නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මගින් විදේශ ගෙවුම් තත්ත්වය පිරිහී යාම වැලැක්වීම සඳහා වර්ෂය තුළදී දැඩි උත්සාහයක් ගනු ලැබීය. මෙම ප්‍රතිපත්ති, විශේෂයෙන්ම ආනයන ගලා එන වේගය අඩු කරලීමට උපකාරී විය.

අපනයන අංශයෙන් නේ, රබර් සහ පොල් නිෂ්පාදිත සඳහා තිබූ අපනයන තීරු බදු, නිෂ්පාදකයන්ගේ ලාභ ශේෂ වැඩි කිරීමේ අරමුණ ඇතිව අඩු කරනු ලැබීය. ආනයන වර්ධනය අඩු මට්ටමක පවත්වා ගනු ලැබුයේ විශාල වශයෙන් ඉල්ලුම් පාලන ප්‍රතිපත්ති මගිනි. විශේෂයෙන්ම වර්ෂය තුළදී, ණය ලබා ගැනීමේ වියදම් වැඩි කිරීම සහ ණය පහසුකම් සීමාකිරීම මගින් ආනයන ගලා ඒම අඩු කරනු ලැබීය. ආයෝජන එක්වර ක්ෂය කිරීමේ ක්‍රමය ඉවත් කිරීමද ආනයන ගලා ඒම අඩු කිරීමට ඉවහල් විය. රාජ්‍ය අංශයේ වැය සීමා කිරීමද ආනයන වර්ධනය තවදුරටත් අඩු කිරීමට හේතු විය. වර්ෂය මුලදී ආයාත භාණ්ඩ භාවිතය විශාල වශයෙන් ඉහළ මට්ටමක පැවතීමෙන් රටෙහි විදේශ වත්කම් තත්ත්වය මත ඇති වූ දැඩි පීඩනය සලකා බලන කල මෙවැනි සීමා කරණයන් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය දෙයක් වී තිබුණි.

විනිමය අනුපාතික තවදුරටත් වඩා නම්‍ය වූ අතර, එය ගෙවුම් තුලන ස්වභාවය මගින් ඉඩ හරිනු ලැබූ ඉල්ලුම් - සැපයුම් තත්ත්වයන් පිළිබිඹු කරන්නක් විය. ශ්‍රී ලංකා රුපියලේ අගය තවදුරටත් විදේශීය මුදල් ඒකක ගොනුවක වටිනාකම පදනම් කරගත් බර තබන ලද දර්ශකයක් අනුව තීරණය විය. නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තිය වර්ෂය තුළදී විදේශ ගෙවුම් තත්ත්වය මත වූ පීඩනය තරමක් දුරට ලිහිල් කර ලීමට ඉවහල් විය.

විදේශීය ආයෝජකයන් සඳහා ප්‍රසන්න ආයෝජන පරිසරයක් රටෙහි පවත්වා ගෙන යෑම සඳහා සෑම ප්‍රයත්නයක්ම ගනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් වෙත සෘජු ආයෝජන සඳහා පෞද්ගලික ප්‍රාග්ධනය තවදුරටත් ලැබෙන්නට විය.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ග වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල වෙනස් වූ ආකාරය පිළිබඳ කරන ලද විශ්ලේෂණයට අනුව 1981 දී රුපියලේ වටිනාකම එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 14 කින්ද, ජපන් යෙන් වලට ප්‍රතිමුඛව සියයට 7 කින් ද අඩු විය. මේ අනුව 1977 නොවැම්බර් මස සිට රුපියලේ වටිනාකම මෙම මුදල් ඒකක දෙකට ප්‍රතිමුඛව වූ සමුච්චිත පිරිහීම පිළිවෙළින් සියයට 28 ක්සහ සියයට 43 ක් බවට පත් විය. කෙසේ වුවත් 1981 දී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම ස්ටර්ලිං පවුමට ප්‍රතිමුඛව සියයට 8 කින් ද, ඩොයිෂ් මාර්ක් වලට ප්‍රතිමුඛව සියයට 2 කින් ද, ප්‍රංශ ෆ්‍රෑන්ක් වලට ප්‍රතිමුඛව සියයට 10 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 4 කින් ද වැඩිවී තිබුණි. මෙය ඉහතින් සඳහන් කළ ප්‍රධාන මුදල් ඒකක හයටම ප්‍රතිමුඛව රුපියලේ අගය ක්ෂය වූ 1980 වර්ෂයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වූ තත්ත්වයකි. ශ්‍රී ලංකා රුපියලේ විනිමය වටිනාකමෙහි ඇති වූ මෙම වෙනස්වීම් ජාත්‍යන්තර විනිමය වෙළඳ පොළේ ඇතිවූ වෙනස්කම් වලට මූලික වශයෙන් අනුකූලව සිදුවූ අතර, එම ජාත්‍යන්තර වෙනස්වීම් නිසා 1981 දී එක්සත් ජනපද ඩොලරය ස්ටර්ලිං පවුමට ප්‍රතිමුඛව සියයට 20 කින්ද, ජපන් යෙන් වලට ප්‍රතිමුඛව සියයට 8 කින් ද, ඩොයිෂ් මාර්ක් වලට ප්‍රතිමුඛව සියයට 15 කින්ද, ප්‍රංශ ෆ්‍රෑන්ක් වලට ප්‍රතිමුඛව සියයට 27 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 15 කින්ද වැඩි විය. 1981 දී ජාත්‍යන්තර විනිමය වෙළඳ පොළෙහි එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එය විගැහි වලට ප්‍රතිමුඛව ආසන්න වශයෙන් සියයට 9 කින් වැඩි වූ අතර, ශ්‍රී ලංකා රුපියල විගැහි වලට ප්‍රතිමුඛව සියයට 4 කින් පිරිහුණි.

# විනිමය අනුපාතික

1977 නොවැම්බර් 16 වැනි දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස් වීම්.




ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: 1977 වර්ෂය සඳහා විනිමය අනුපාතික වෙනස් වීම් පෙන්වා ඇත්තේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහාය. සෙසු වර්ෂ වල මෙම වෙනස් වීම් දක්වා ඇත්තේ කාර්තු ගත පදනමක් මතය.

**1·32 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්*, 1979 - 1981**

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (ඒකකයක රුපියල්) | | | පෙර වර්ෂයට වඩා % වෙනස්වීම | | |
|---|---|---|---|---|---|---|
| | 1979 | 1980 | 1981 | 1979 | 1980 | 1981 |
| වි.ගැ.හි. .. | 20·3611 | 22·8977 | 23·8738 | 0·68 | 12·45 | 4·26 |
| ඇ.එ.ජ. ඩොලර් .. | 15·4450 | 18·0000 | 20·5500 | (0·39) | 16·54 | 14·17 |
| එ.රා. ස්ටර්ලින් පවුම් .. | 34·5650 | 42·6955 | 39·0965 | 9·14 | 23·52 | (8·43) |
| ඩොයිෂ් මාර්ක් .. | 9·0000 | 9·2125 | 9·0665 | 5·22 | 2·36 | (1·58) |
| ජපන් යෙන් .. | 0·06454 | 0·08755 | 0·09330 | (22·85) | 35·66 | 6·57 |
| ප්‍රංශ ප්‍රැන්ක් .. | 3·8600 | 3·9750 | 3·5800 | 3·04 | 2·98 | (9·93) |
| ඉන්දියානු රුපියල් .. | 1·9400 | 2·2875 | 2·2063 | 1·76 | 17·91 | (3·55) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* වරහන් තුළ ඇති සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියලෙහි අගය වැඩිවීම පෙන්නුම් කරයි.

**විදේශ වත්කම්**

වර්ෂය තුළදී ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 406 (විගැහි දශ ලක්ෂ 26) කින් පහත වැටුණු අතර, දළ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 2,456 (විගැහි දශලක්ෂ 91.4) කින් වැඩිවුණි. 1981 අවසානයේදී ශුද්ධ විදේශ වත්කම් 1977 න් පසුව වූ පහත්ම මට්ටමට වැටී තිබුණි. මෙසේ ශුද්ධ විදේශ වත්කම් තියුණු ලෙස පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ මහ බැංකුවේ සහ වාණිජ බැංකුවල වගකීම් වැඩි වීමයි. උදහරණ වශයෙන් 1981 දී මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය භාවිතා කිරීම සියයට 64 කින් වැඩි වූ අතර, වාණිජ බැංකුවල විදේශ ණය ගැනීම් සියයට 23 කින් වැඩි විය.

1981 අවසානයේදී මහ බැංකුව, වාණිජ බැංකු, රජය සහ රාජ්‍ය නියෝජ්‍යායතන සහ ආයතන සතුව පැවැති දළ විදේශ වත්කම් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 6,743.2 (විගැහි දශලක්ෂ 283.5), රුපියල් දශලක්ෂ 2,343.3 (විගැහි දශලක්ෂ 98) සහ රුපියල් දශලක්ෂ 135.7 (විගැහි දශලක්ෂ 5.7) ක් විය. 1981 වර්ෂය අගදී පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණවත් වූයේ 1982 වර්ෂය සඳහා සිදු කිරීමට බලාපොරොත්තු වූ ආනයන වලින් මාස දෙකකට වඩා සුළු වශයෙන් වැඩි ප්‍රමාණයක් පියවීමට පමණි.

**විදේශ ණය සහ ණය සේවාකරණය**

දිගුකාලීන ණය, රාජ්‍ය අංශයේ සැපයුම් කරුවන්ගේ ණය (රාජ්‍ය අංශයේ සංස්ථා ඇතුළුව), ජා.මු.අ. ගැණුම් සහ විදේශ ණය ගැණුම් ඇතුළත් වූ නොපියවූ ඉතිරි මුළු ණය 1980 දී රුපියල් දශලක්ෂ 25,828 (විගැහි දශලක්ෂ 1,203) සිට 1981 දී රුපියල් දශලක්ෂ 34,824 (විගැහි දශලක්ෂ 1,476) දක්වා සියයට 23 කින් (විගැහි අනුව) වර්ධනය විය. පිළිවෙලින් සියයට 41 කින් සහ සියයට 83 කින් සැපයුම්කරුවන්ගේ ණය සහ ජා.මු.අ. ගැණුම් වර්ධනය වූ අතර, නොපිය වූ ඉතිරි දිගුකාලීන ණය සියයට 31 කින් වර්ධනය විය. දිගුකාලීන ණය වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ දිගුකාලීන ණය අංශයෙහි විශාලම කොටස හිමිකරගන්නා (පිළිවෙලින් සියයට 32 ක් සහ සියයට 60 ක්) යෝජනා ක්‍රම ණය සහ ද්‍රව්‍ය ණය වැඩි වීමය. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී නොපියවූ කෙටිකාලීන බැංකු ණය ගැනීම් ප්‍රමාණය 1981 දී සියයට 38 කින් පහත වැටුනි.

දිගුකාලීන විදේශ ණය, රාජ්‍ය අංශයේ සැපයුම් කරුවන්ගේ ණය, ජා.මු.අ. ගැනුම් සහ විදේශ බැංකු සහ අනිකුත් ආයතන වලින් ණය ගැනීම් සම්බන්ධයෙන් වූ ණය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් ඇතුළත් වූ ණය සේවාකරණය 1980 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 2,763 (විගැහි දශලක්ෂ 137) සිට 1981 දී රුපියල් දශලක්ෂ 3,529 (විගැහි දශලක්ෂ 150) දක්වා වැඩි විය. 1980 දී සියයට 16 ක් වූ වර්ධනය සමග සසඳන කළ විගැහි අනුව මෙම වර්ෂය තුළ සියයට 9 ක

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව



වැඩිවීමක් පෙන්නුම් කරයි. විගැහි අනුව අනිකුත් ණය සඳහා වූ ණය සේවා කරණය සියයට 4 කින් පහත වැටුන අතර ජා.මු.අ. ප්‍රති මිලදී ගැනීම් (ආපසු ගෙවීම්) පොළී ගෙවීම් සහ සේවා ගෙවීම් සියයට 28 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත ණය සේවා අනුපාතිකය 1980 දී සියයට 12.4 සිට සියයට 13.4 දක්වා වැඩි වූ අතර ජා.මු.අ. ගනුදෙනු හැර ණය සේවා අනුපාතිකය 1980 සියයට 7.5 සිට 1981 දී සියයට 6.8 දක්වා පහත වැටුණි.

**1 · 33 සංඛ්‍යා සටහන**

**නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය (අ) සහ ණය සේවා ගෙවීම්, 1977-1981**

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| වර්ගය | 1977 | 1978 | 1979 | 1980(ආ) | 1981(ඇ) |
|---|---|---|---|---|---|
| 1· දිගුකාලීන ණය .. | 10,593·5 | 14,582·3 | 15,840·6 | 22,276·8 | 29,172·2 |
| එයින්, | (560·5) | (720·7) | (778·0) | ( 1,035·2) | (1,224·2) |
| 1·1 යෝජනා ක්‍රම ණය .. | 3,072·1 | 4,833·1 | 5,569·5 | 6,784·3 | 9,232·8 |
| | (162·5) | (238·9) | (273·5) | (315·3) | (387·4) |
| 1·2 යෝජනා ක්‍රම නොවන ණය .. | 7,521·4 | 8,969·9 | 8,900·9 | 13,305·5 | 17,433·3 |
| | ( 398·0) | (443·3) | (437·2) | (618·3) | (731·6) |
| 1·3 ජා. මු. අ. භාරකාර අරමුදල් ණය | — | 779·3 | 1,370·2 | 2,187·0 | 2,506·1 |
| | | (38·5) | (67·3) | (101·6) | (105·2) |
| 2· සැපයුම් කරුවන්ගේ ණය .. | 963·2 | 991·4 | 828·6 | 787·6 | 1,110·4 |
| | (51·0) | (49·0) | (40·7) | (36·6) | (46·6) |
| 3· ජා·මු·අ· ගැනීම් .. | 1,212·3 | 1,548·0 | 2,501·3 | 2,335·1 | 4,274·6 |
| | (64·1) | (76·5) | (126·3) | (112·6) | (194·3) |
| 4· බැංකු ණය ගැනීම් .. | 552·3 | 155·1 | 69·1 | 428·6 | 266·9 |
| | (29·2) | (7·7) | (3·4) | (18·7) | (11·2) |
| 5· නොගෙවා ඇති මුළු ණය .. | 13,321·3 | 17,276·8 | 19,239·6 | 25,828·1 | 34,824·1 |
| | (704·8) | (853·9) | (948·3) | (1,203·0) | (1,476·3) |
| 6· ණය සේවා ගෙවීම් .. | 1,211·9 | 2,347·2 | 2,383·1 | 2,762·8 | 3,528·8 |
| | (116·3) | (119·8) | (118·0) | (137·0) | (149·5) |
| 6·1 ණය ආපසු ගෙවීම් .. | 966·9 | 1,862·4 | 1,627·4 | 1,781·5 | 2,121·3 |
| | (92·8) | (95·1) | (80·8) | (91·4) | (88·3) |
| (අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට .. | 219·2 | 440·4 | 622·6 | 748·5 | 1,289·2 |
| | (21·0) | (22·5) | (30·9) | (43·4) | (51·9) |
| (ආ) වෙනත් .. | 747·7 | 1,422·0 | 1,004·8 | 1,033·0 | 832·1 |
| | (71·8) | (72·6) | (49·9) | (48·0) | (36·4) |
| 6·2 පොළී ගෙවීම් .. | 245·0 | 484·8 | 755·7 | 981·3 | 1,407·5 |
| | (23·5) | (24·7) | (37·2) | (45·6) | (61·2) |
| (අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට .. | 43·2 | 154·4 | 170·0 | 345·6 | 446·6 |
| | (7·0) | (7·9) | (8·4) | (12·4) | (19·7) |
| (ආ) වෙනත් .. | 171·8 | 330·4 | 585·7 | 635·7 | 960·9 |
| | (16·5) | (16·8) | (28.8) | (33·2) | (41·5) |
| 7· වෙළඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපැයුම් .. | 7,563·2 | 15,148·8 | 18,274·7 | 22,208·0 | 26,255·0 |
| | (725·8) | (773·7) | (907·7) | (1,032·0) | (1,156·0) |
| 8· ණය සේවා අනුපාතිකය (ඈ) (6,7 හි ප්‍රතිශතයක් වශයෙන්) .. | 16·0 | 15·5 | 13·0 | 12·4 | 13·4 |
| 9· ණය සේවා අනුපාතිකය (ඈ) (ජා.මු.අ. ගනුදෙනු හැර) .. | 12·2 | 11·6 | 8·7 | 7·5 | 6·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) කෙටිකාලීන වෙළඳ ණය හැර.

(ආ) සංශෝධිතයි.

(ඇ) තාවකාලික.

(ඈ) රුපියල් අගය අනුව ගණන් බලා ඇත. විනිමය අනුපාතික වර්ෂය තුලදී වෙනස් වන බැවින් විගැහි අනුව ගණන් බැලුව හොත්, ණය සේවා අනුපාතිකය මෙම අනුපාතික වලට වඩා වෙනස් විය හැක.